# FPA පුවත් සංග්‍රහය

2013 දෙවන කලාපය

fpa SRI LANKA
enriching relationships

60
1953 - 2013

www.fpasrilanka.org


**සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ (MDG) - 5b ජය ගැනීම...**

# 2020 දී සැමට ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය අයිතිවාසිකම්



ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිනී වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දු පුල්ලේ මහත්මිය, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ජයශ්‍රී රංගා මහතා සහ ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ විධායක අධ්‍යක්ෂිකා තුෂාරා ආගුස් මහත්මිය මේ අවස්ථාවට සහභාගී වූහ.

## වාර්ෂික වාර්තාවට ජාත්‍යන්තර සම්මාන

**ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ 2012 වාර්ෂික වාර්තාවට ජාත්‍යන්තර සම්මාන 6ක් හිමිව තිබේ. රන් සම්මාන 2ක් සහ රිදී සම්මාන 3ක් සහ ගෞරව සම්මානයක් ලෙස මෙම සම්මාන හිමිව ඇත්තේ ජාත්‍යන්තර ARC සම්මාන පිරිනැමීම මඟිනි.**

ARC සම්මාන ප්‍රදානය වාර්ෂික වාර්තා සඳහා ලොව පැවැත්වෙන විශාලතම සම්මාන ප්‍රදාන අවස්ථාවකි. මෙවර මෙම සම්මාන ප්‍රදානය සඳහා ලොව පුරා රටවල් 34කින් ඇතුලත්වීම 2,260ක් එක්ව ඇත. ලාබ නොලබන සහ සමාජසේවා සංවිධාන කාණ්ඩය යටතේ සමස්ත සැකැස්ම සඳහා රන් සම්මානයක් ද මුද්‍රණය සහ නිමාව සඳහා රන් සම්මානයක් ද මෙහිදී හිමිව ඇත.

මීට අමතරව ගරු සභාපති තුමියගේ පණිවිඩය, අභ්‍යන්තර සැකැස්ම, කවර නිර්මාණය සඳහා රිදී සම්මානය හිමිව තිබේ ARC සම්මාන ප්‍රදානය පසුගිය සැප්තැම්බර් මාසයේදී ඇමරිකාවේ නිව්යෝක් නුවරදී පැවැත්විය.

## දකුණු ආසියා පාර්ලිමේන්තු නියෝජිතයින්ගේ වැඩමුළුව තායිලන්තයේ බැංකොක් නුවරදී....

**සැමට ලිංගික හා ප්‍රජනක සෞඛ්‍ය සහ අයිතිවාසිකම් යන්න තේමා කර ගනිමින් ඒ පිළිබඳ දකුණු ආසියා පාර්ලිමේන්තු නියෝජිතයන්ගේ අවධානය යොමු කරවීම සඳහා වැඩමුළුවක් තායිලන්තයේ බැංකොක් නුවරදී පසුගිය අගෝස්තු මාසයේ පැවැත්විය.**

සැලසුම් කළ මාපිය භාවය පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයේ දකුණු ආසියා (IPPF - SARO) කලාපීය කාර්යාලය විසින් මෙය සංවිධානය කරන ලදි.

## ගෝලීය අරමුදල අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වන HIV වළක්වා ගැනීමේ ව්‍යාපෘතිය ඇරඹේ...

3 පිටුව




ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ගරු භාණ්ඩාගාරික ඉස්මත් ඉසඩීන් මහතා (වමේ) වාර්ෂික වාර්තාව සඳහා හිමි වූ රන් සම්මානය, ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝක් නුවර සී. ජේ සමාගම් සමූහයේ සභාපති ජේ. මැන්ඩරිනෝ මහතා අතින් ලබාගත් අවස්ථාව.

# වාර්ෂික මහා සභාව පැවති අවස්ථාව



ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ගරු සභාපතිනි විශේෂඥ වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය (ඉහළ මැද), ගරු ලේකම් අරුණි අකුරුටියේගම මහත්මිය (ඉහළ වමේ) ඇතුළු නිලධාරීන් සහ ජාතික මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන් (දකුණේ ඡායාරූප) මහා සභාරැස්වීමට එක්ව සිටි අයුරු.





## SLIM සම්මානයක්




ශ්‍රී ලංකා අලෙවිකරන ආයතනයේ වාර්ෂික සම්මාන ප්‍රදානයේදී ඖෂධ බෙදාහැරීම් අංශයේ රිදී සම්මානය ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ අලෙවි විධායක සමන් ඒකනායක මහතා විසින් හිමි කරගන්නා ලදි. මෙම සම්මානය ස්වාධීන රූපවාහිනී සේවය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) ජේ. ඒ. උපාලි රංජිත් මහතා වෙතින් ලබාගත් අවස්ථාව.

## නව වෙබ් අඩවියට පිවිසෙන්න...




ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංමයේ නව වෙබ් අඩවිය විවෘත කිරීම ගරු සභාපතිනී විශේෂඥ වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය. මෙම අවස්ථාවට එක්වූ ගරු හිටපු සභාපති මේජර් ෂර්ලි ද සිල්වා මහතා සහ ගරු හිටපු ලේකම් ලාල් හේවාපතිරණ මහතා ඡායාරූපයේ වෙති. කොළඹ විශ්ව විද්‍යාලයේ උප කුලපති ආචාර්ය ඩබ්. කේ. හිරුඹුරේගම මහතා විශේෂ ආරාධිතයෙකු ලෙස මෙම අවස්ථාවට සහභාගී විය.

# ගෝලීය අරමුදල අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වන HIV වළක්වා ගැනීමේ ව්‍යාපෘතිය ඇරඹේ

ශ්‍රී ලංකාව තුළ දැනට පවතින **HIV** තත්ත්වය තවදුරටත් ව්‍යාප්ත වීම පාලනය කිරීමත්, **HIV** සමඟ ජීවත් වන්නන්ට අවශ්‍ය රැකවරණය ලබා දීමත්, සෞඛ්‍යය සේවා සහ පහසුකම් සැපයීමත්, තොරතුරු සම්පාදනය කර ගැනීමත්, මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වේ.

කාන්තා ලිංගික ශ්‍රමිකයින්, පිරිමින් සමඟ ලිංගිකව හැසිරෙන පිරිමින්, මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්, මුහුදු වෙරළ ආශ්‍රිතව විදේශිකයින් සඳහා සේවා සපයන්නන්, **HIV** සමඟ ජීවත් වන්නන් සහ බන්ධනාගාර රැඳවියන් **HIV** වැඩි අවදානම් කණ්ඩායම් ලෙස හඳුනාගෙන තිබේ.

**HIV** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන සම්බන්ධීකාරකයින් ලෙස සෞඛ්‍ය අමාත්‍යංශයේ ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන ජාතික වැඩසටහනත්, ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයත් කටයුතු කරනු ලබයි.



වමේ සිට : ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ විධායක අධ්‍යක්ෂිකා තුෂාරා ආගුස් මහත්මිය POSITIVE HOPES ALLAINS ආයතනයේ සුනන්දා ජයරත්න මහත්මිය, ගෝලීය අරමුදලේ කලාපීය නියෝජනය වෙනුවෙන් සිල්වියා මාරේ මහත්මිය, ජාතික ලිංගාශ්‍රිත රෝග සහ ඒඩ්ස් මර්දන වැඩසටහනේ අධ්‍යක්ෂ විශේෂ වෛද්‍ය සිසිර ලියනගේ මහතා, UNAIDS ආයතනයේ සම්බන්ධීකාරක වෛද්‍ය දයනාත් රණතුංග මහතා.



ගෝලීය අරමුදලේ නියෝජිතයින් පිරිසක් නිරීක්ෂණ චාරිකාවක යෙදුනු අවස්ථාවක්...



## විශේෂ හැකියා සහිත පුද්ගලයින් වෙනුවෙන් වෛද්‍ය සායනයක්

ශ්‍රී ලංකාව සමාජ සේවා දෙපාර්තමේන්තුව, සවිය සංවර්ධන පදනම සමඟ එක්ව ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ ලිලී ව්‍යාපෘතිය යටතේ විශේෂ හැකියා සහිත පුද්ගලයින් වෙනුවෙන් වෛද්‍ය සායනයක් ගාල්ල දිස්ත්‍රික්කයේ කඩවත්සතර දිසා ලේකම් කාර්යාලයේදී පැවති අවස්ථාව. කළමනාකාරිනී සුනීතා රත්නායක මහත්මිය විසින් මෙහි සංවිධාන කටයුතු සිදුකරන ලදි.



# ලෝක ළමා දිනය වෙනුවෙන් දිස්ත්‍රික්ක 5ක වැඩසටහන්

## ගාල්ල

**මෙවර ලෝක ළමා දිනය වෙනුවෙන් ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ සුව සේවා මධ්‍යස්ථාන පිහිටි දිස්ත්‍රික්ක 5 තුළ විශේෂ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක විය. විධායක අධ්‍යක්ෂිකා තුෂාරා ආගුස් මහත්මිය සහ නියෝජ්‍ය විධායක අධ්‍යක්ෂක ලසන්ත ගුණරත්න මහතාගේ මඟ පෙන්වීම යටතේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්. වී. පී. රාජපක්ෂ මහතා ඇතුළු කාර්ය මණ්ඩලයේ දායකත්වයෙන් මෙම වැඩසටහන් සංවිධානය විය.**





ගාල්ල දිසා ලේකම් කාර්යාලයේ පැවැති ප්‍රදේශයේ දරු දැරියන් සහ ගුරුවර ගුරුවරියන් දැනුවත් කිරීමේ වැඩසටහන ගාල්ල දිස්ත්‍රික් ලේකම් රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා විසින් පොල්තෙල් පහන දල්වා ආරම්භ කළ අවස්ථාව. (ඉහළ ඡායාරූපය) ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ සහකාර අධ්‍යක්ෂ සුනිල් සේනාරත්න මහතා සභාව අමතමින් (වමේ ඡායාරූපය)

ගාල්ල දිස්ත්‍රික් වැඩසටහන සඳහා ගාල්ල දිස්ත්‍රික් ක්‍රම සම්පාදන අධ්‍යක්ෂිකා පුෂ්පා මලලසේකර මහත්මිය, ගාල්ල දිස්ත්‍රික් කාන්තා බල මණ්ඩලයේ සභාපතිනී කේ.ජී.පී. ඉන්ද්‍රපාල මහත්මිය, රුහුණු විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ මහාචාර්ය ඒ .කේ. ජී ජයසිංහ මහතා, ඉමදූව පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිනී ඒ. එම් නානායක්කාරවසම් මහත්මිය, කොග්ගල සුවසේවා මධ්‍යස්ථානයේ කළමනාකාර නිශාන්ත හෙට්ටිආරච්චි මහතා ඇතුළු පිරිසක් සහභාගී වූහ.

## අම්පාර



අම්පාර - ලාහුගල මහා විද්‍යාලයේ පැවති විවාද තරගාවලිය සහ පෝස්ටර් චිත්‍ර ප්‍රදර්ශනය ආරම්භ කරමින්... මෙම වැඩසටහන අම්පාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සුනිල් ගුණතිලක මහතා සහ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂකතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විය. අම්පාර සුවසේවා මධ්‍යස්ථානයේ කළමනාකර ජී. එස්. විජේරත්න මහතා සහ වැඩසටහන් නිලධාරි ජයසිරි කුලරත්න මහතා විසින් මෙය සංවිධානය කරන ලදී.





5 වැනි පිටුවට.....

4 පිටුවෙන්.....

## ලෝක ළමා දිනය... මඩකලපුව








මඩකලපුව දිස්ත්‍රික්කයේ පාසල් ගණනාවක නාට්‍ය සංදර්ශන පැවැත්වීම සිදුවිය. ඉහත දැක්වෙන්නේ එක් පාසලකදී නාට්‍යයක් වේදිකා ගත කළ අවස්ථාවකි.

ලෝක ළමා දින වැඩසටහන් කොළඹ දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ සුව සේවා මධ්‍යස්ථාන මගින්ද සංවිධානය කරන ලදි.

නව යොවුන්වියේ ගැබ් ගැනීම් ඇතිවීමෙන් සිදුවිය හැකි සෞඛ්‍යය ගැටලු අවම කර ගැනීම මෙම වැඩ සටහන්වල තේමාව විය.

## ක්ෂේත්‍ර නිරීක්ෂණ චාරිකාව

ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ සුව සේවා මධ්‍යස්ථානයන්හි කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා ජාතික මණ්ඩලයේ මහත්ම මහත්මීන් කිහිප දෙනෙක් නිරීක්ෂණ චාරිකාවක නිරත වූහ. එහි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.



ගරු සභාපතිනී විශේෂඥ වෛද්‍ය ප්‍රාමිලා සේනානායක මහත්මිය, තොරතුරු අධ්‍යාපන සහ සන්නිවේදන කමිටුවේ ගරු සභාපතිනි වෛද්‍ය එස්තර් අමරසේකර මහත්මිය ඇතුළු පිරිස නුවරඑළිය සුව සේවා මධ්‍යස්ථානයේදී.





හිටපු ගරු සභාපති මේජර් ෂර්ලි ද සිල්වා මහතා, හිටපු ගරු ලේකම් ලාල් හේවාපතිරණ මහතා සහ පරිපාලන අධ්‍යක්ෂිකා කුසුම් ද සිල්වා මෙනෙවිය මඩකලපුව සුව සේවා මධ්‍යස්ථානයේදී.

# FPA පුවත් සංග්‍රහය

2013 දෙවන කලාපය

www.fpasrilanka.org

**සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ (MDG) - 5b ජය ගැනීම...**

**ප්‍රජනක සෞඛ්‍ය පිළිබඳ තොරතුරු, වෛද්‍ය උපදෙස් හෝ උපදේශන සේවා ඔබ ඉන්නා තැන සිටම ලබාගැනීමට**
**අමතන්න 2 588 488**
**පිවිසෙන්න www.happylife.lk**
**SMS කරන්න 071 6 408 408**

37/27, බුලර්ස් පටුමග, කොළඹ 07. දුරකථන : 011 2 555 455
ෆැක්ස් : 011 2 55 66 11 ඊ මේල් : fpa@fpasrilanka.org




## තරුණ පිරිස සඳහා ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය නැගෙනහිර පළාතේ ක්‍රියාවට නැංවීම



තරුණ පිරිස සඳහා ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය නැගෙනහිර පලාතේ ක්‍රියාවට නැංවීම සඳහා ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමේ වැඩමුළුව නැගෙනහිර පලාත් ප්‍රධාන අමාත්‍ය නජීබ් අබ්දුල් මජීඩ් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විනි. මෙම අවස්ථාවට එම පලාතේ නිළධාරීන් රැසක් සහභාගී වූහ.




ප්‍රධාන අමාත්‍ය ගරු නජීබ් අබ්දුල් මජීඩ් මැතිතුමා සහ අධිවාචන සහ HIV ඒකකයේ අධ්‍යක්ෂිකා මදූෂා දිසානායක මහත්මිය ඇතුළු විද්වත් මණ්ඩලය

සංස්කරණය : ආනන්ද බෝධිනායක - ananda@fpasrilaka.org
සම්බන්ධීකරණය : අධිවාචන (Advocacy) ඒකකය